වෙබ් අඩවිය
இணைய தளம்
Web Site } www.prda.cp.gov.lk

# පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
# මධ්‍යම පළාත් සභාව
## மாகாண வீதி அபிவிருத்தி அதிகார சபை
## மத்திய மாகாண சபை
## CENTRAL PROVINCIAL COUNCIL
## PROVINCIAL ROAD DEVELOPMENT AUTHORITY

සභාපති / தலைவர் / Chairman 081-2204376

සාමාන්‍යාධිකාරී / பொது முகாமையாளர் / General Manager 081-2202978

ෆැක්ස් / பெக்ஸ் / Fax 081-2204606, 081-2202987

කාර්යාලය / அலுவலகம் / Office 081-2204378

අංක 09, ඇහැලේපොල කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර
இல. 09, எஹலேபொல குமாரிஹாமி மாவத்த, போகம்பர, கண்டி.
No. 09, Ehalepola Kumarihami Mawatha, Bogambara, Kandy.
Email - cpprda@yahoo.com / prdacpkd@gmail.com

CPC/PRDA/ 1/3/5 /Ten/ 2025

මගේ අංකය / எனது இல. / My No. ..........................

ඔබේ අංකය / உமது இல. / Your No. ..........................

දිනය / திகதி / Date 2025.04.22 .

සියළුම කොන්ත්‍රාත් ආයතන වෙත,

**<u>2025 වර්ෂයේ පළමු අදියර ප්‍රසම්පාදන කැඳවීම</u>**

**<u>පූර්ව ලංසු රැස්වීම - 2025.04.21</u>**

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය යටතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන සහ මාර්ග නඩත්තු ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ 2025 අප්‍රේල් මස 02 දින දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් පුවත්පත් වල පලකරන ලද ප්‍රසම්පාදන දැන්වීමට අනුව 2025.04.21 දින පෙ.ව 10.30ට කොන්ත්‍රාත් ආයතන නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වූ පූර්ව ලංසු රැස්වීම් වාර්තාව පහතින් ඉදිරිපත් කරමි.

- මෙදින පූර්ව ලංසු රැස්වීම සඳහා පහත නිලධාරින් සහභාගී විය.
  1) පී.එම්.අයි.යූ.කේ. පුවක්ගොල්ල මයා, - සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
  2) ජේ.එම්.ආර්.බී ජයවර්ධන මයා, - මුලස්ථාන ප්‍රධාන ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරී
  3) ඒ.පී.පී.බී. දේශප්‍රිය මයා, - ප්‍රධාන ඉංජිනේරු, මහනුවර/මාතලේ, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
  4) එම්.පී.සී.ඩී. මහගෙදර මයා - විධායක ඉංජිනේරු, හාරිස්පත්තුව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,

01. මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පැමිණ සිටි සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදි. එහි දී ලංසුකරුවන් වෙත ඉදිරිපත් කරන ලද සංශෝධන හා උපදෙස් පහත පරිදි වේ.

02. පුවත්පත් දැන්වීමේ ඇති සංශෝධනයන් සම්බන්ධව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියට ඇතුලත් කරන බව 2025.04.07 දින දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් පුවත්පත් වල දැන්වීමක් නැවත පල කර ඇති බවට පිරිස දැනුවත් කරන ලදි.

03. තවද පුවත් පත් දැන්වීමේ අනු අංක 9. 10, 11 සහ 12 ට අදාල කොන්ත්‍රාත් අංකයේ සංශෝධනයන් පහත සඳහන් පරිදි විය යුතු බව දන්වන ලදි. මේ වන විට නිකුත් කළ ලංසු පත්‍රිකා සියල්ල නිවැරදි ලෙස සකසා ඇති බව වැඩිදුරටත් දන්වන ලදි.

| අනු අංක | පුවත්පත් දැන්වීමේ සඳහන් කර ඇති ආකාරය | සංශෝධනය වූ පසු වෙබ් අඩවියේ සඳහන් නිවැරදි කිරීම |
|---|---|---|
| 09 | CPC/PRDA<u>K</u>/PSDG/K/GAM/2025/01 | CPC/PRDA/PSDG/K/GAM/2025/01 |
| 10 | CPC/PRDA<u>K</u>/PSDG/K/GAM/2025/02 | CPC/PRDA/PSDG/K/GAM/2025/02 |
| 11 | CPC/PRDA<u>K</u>/PSDG/K/GAM/2025/03 | CPC/PRDA/PSDG/K/GAM/2025/03 |
| 12 | CPC/PRDA<u>K</u>/PSDG/K/GAM/2025/04 | CPC/PRDA/PSDG/K/GAM/2025/04 |

04. විද්‍යුත් තැපැල මගින් ඉල්ලීම් කරන කොන්ත්‍රාත් ආයතන සඳහා පමණක් අදාල ලංසු පත්‍රිකා වල මෘදු පිටපත් යොමු කරන අතර ලංසුකරු විසින් මුල් පිටපත සහ අනු පිටපත ලෙස දෘඩ පිටපත් 02 ක් ලබා ගත යුතුය. එම ලංසු පත්‍රිකා සම්පූර්ණ කරන ආකාරය පිළිබඳ සහ එම ලංසු පත්‍රිකා ප්‍රසම්පාදන කමිටුව වෙත භාරදීම සිදුකළ යුතු ආකාරය පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් සිදුකරන ලදි.

05. ලංසු ඇපකර සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 09, ඇහැලේපොළ කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර යන ලිපිනයට බැංකු ඇපකරයක් ලෙස රජයේ පිළිගත් වානිජ බැංකුවකින් (Central Bank Approved) ඉදිරිපත් කළයුතු බවත් එහි මුල් පිටපත ලංසුව සමඟ ඉදිරිපත් කළයුතු බවත් පැහැදිලි කරන ලදි.

06. ලංසු ඇපකරය මුදලින් ගෙවන්නේ නම් අදාල කර්මාන්තයේ විස්තර සහිතව මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී නමට **මහජන බැංකුවේ අංක 158 100 11 00000 22** ගිණුම් අංකයට බැර කර ලබාගත් නිවරදි තොරතුරු ඇතුලත් කුවිතාන්සියේ මුල් පිටපත මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගණකාධිකාරී වෙත ඉදිරිපත් කර අදාල ලදුපත ලබා ගත යුතුය. එම ලදුපත ලංසු පත්‍රිකා සමඟ ඉදිරිපත් කළ යුතු බවත් පැහැදිලි කරන ලදි.

07. ලංසුකරුවන්ගේ මුල්‍ය හැකියාව සනාථ කිරීම සඳහා ලංසු පත්‍රිකා වල ඉල්ලා ඇති පරිදි රජයේ පිළිගත් වානිජ බැංකුවක් මගින් (Central Bank Approved) ලබාගත් වලංගු ලියකියවිලි මුල් පිටපත් ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි.

08. ලංසු අගය මිලියන 05 හෝ ඊට වැඩි කර්මාන්ත සඳහා අදාල ලංසු 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත අනුව සමාගම් මැදුරේ ලියාපදිංචි වී ලබා ගත් සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතු බවට දැනුවත් කරන ලදි.

09. CIDA ආයතනයේ ලියාපදිංචිය සනාථ කර ගැනීම සඳහා එම ආයතනය විසින් නිකුත් කරන ලද පොතේ හි කොන්ත්‍රාත් ආයතනයේ විස්තර ඇතුලත් කර ඇති පිටුවේ සහ අවසන් වරට යාවත්කාලීන කළ ශ්‍රේණිය සහ දිනය ඇතුලත් වන පිටුවේ ඡායාපිටපත් ලංසුව සමග ඉදිරිපත් කිරීම කළ යුතුය. ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් සැපයීම සඳහා ඇස්ෆෝල්ට් නිශ්පාදනය කර බෙදා හැරීමට අදාල ව්‍යාපාර ලියාපදිංචියත්, තාර සහ දියර තාර සැපයීම සඳහා රාජ්‍යයේ ලියාපදිංචිය අනිවාර්ය කරුණක් බව පවසන ලදි.

10. ඇස්ෆෝල්ට් ඇතිරීමේ ඇතිරීමේ කර්මාන්තවලට අදාල කරුණුපැහැදිලි කළ අතර, අදාල වන කොන්ත්‍රාත් උපදෙස්වල සුළු සංශෝධනයන් සිදුවන බව දැනුවත් කරන ලදි. එය Addendum 01 ලෙස ඊට අදාල සියලුම කොන්ත්‍රාත් ආයතන වෙත යොමු කරන බව දන්වන ලදි.

11. කොන්ත්‍රාත් ආයතනවල පසුගිය වසරවල ඉටු කළ කර්මාන්ත සම්බන්ධයෙන් විස්තර සහ කොන්ත්‍රාත් ආයතනයේ සුදුසුකම් අදාල ලැයිස්තුවේ ඇතුළත් කළ යුතු බවත් එම විස්තර සනාථ කිරීමේ ලියකියවිලි අමුණා තිබිය යුතු බවත් පවසන ලදි. එහි දී පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඉටු කර ලද කර්මාන්ත පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතු බව වැඩිදුරටත් පවසන ලදි.

12. ලංසු පත්‍රිකාවේ සඳහන් ප්‍රමාණ පත්‍රයේ අනුපාත සහ මිල ගණන් සඳහන් කිරීමේ දී ඒ සඳහා පැහැදිලි අත් අකුරු භාවිතා කරන ලෙසටත් අනවශ්‍ය ලෙස කටුගෑමට ලක්කිරීම හෝ මකන දියර භාවිත නොකරන ලෙසටත් උපදෙස් ලබා දෙන ලදි. ඒ වැනි අවස්ථාවක එම වැරදි අගයන් මත තනි ඉරක් භාවිතා කර කැපීම සිදුකර නිවැරදි අගයන් යොදා එම ස්ථානයේ ලංසුකරුගේ අත්සන යෙදීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් අවධාරනය කරන ලදි.

13. ඉහත සඳහන් අඩුපාඩු සහිත ලංසු පත්‍රිකා තරඟකාරී ලංසු මිළගණන් වෙත යොමු වන විට ප්‍රතික්ෂේප වීමට හැකියාව ඇති බව වැඩිදුරටත් දන්වා සිටින ලදි.

14. කොන්ත්‍රාත් කාල සීමාව ඉතා සීමිත බැවින් ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදුකර තමන්ගේ හැකියාවන්ට අනුව ඉතා නිවැරදි ලංසු ඉදිපත් කිරීම සුදුසු බවට දැනුවත් කරන ලදි.

15. ප්‍රසම්පාදනයට අදාලව තවදුරටත් පැහැදිලි කිරීම් හෝ ප්‍රශ්න කිරීම් වේ නම් ඒවා ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියත් වෙනත් ප්‍රශ්න හෝ හේතු පැහැදිලි කිරීම් කිසිවක් නොවුයෙන් ලංසු ඉදිරිපත් කිරීමේ දී පැහැදිලි කරන ලද කරුණු කෙරෙහි අවධානය යොමු කොට කටයුතු කරන ලෙස දන්වා පැමිණි සිටි සියල්ලන්ට ස්තූති කරමින් රැස්වීම අවසන් කරන ලදි.

ඉංජි.පී.එම්.අයි.යූ.කේ. පුවක්ගොල්ල
සාමාන්‍යාධිකාරී
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
මධ්‍යම පළාත

පී.එම්.අයි.යූ.කේ පුවක්ගොල්ල,
සාමාන්‍යාධිකාරී
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
මධ්‍යම පළාත.

පිටපත්,
1. සභාපති - ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන,ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස ඉදිකිරීම් අමාත්‍යංශය මධ්‍යම පළාත. - කා.දැ.ගැ.පි
2. සභාපති - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - කා.දැ.ගැ.පි
3. මූලස්ථාන ප්‍රධාන ඉංජිනේරුතුමා - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - කා.දැ.ගැ.පි

වෙබ් අඩවිය / இணைய தளம் / Web Site } www.prda.cp.gov.lk

# පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
# මධ්‍යම පළාත් සභාව

**மாகாண வீதி அபிவிருத்தி அதிகார சபை**
**மத்திய மாகாண சபை**

**CENTRAL PROVINCIAL COUNCIL**
**PROVINCIAL ROAD DEVELOPMENT AUTHORITY**

සභාපති / தலைவர் / Chairman 081-2204376
සාමාන්‍යාධිකාරී / பொது முகாமையாளர் / General Manager 081-2202978
ෆැක්ස් / பெக்ஸ் / Fax 081-2204606, 081-2202987
කාර්යාලය / அலுவலகம் / Office 081-2204378

අංක 09, ඇහැලේපොල කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර
இல. 09, எஹலேபொல குமாரிஹாமி மாவத்த, போகம்பர, கண்டி.
No. 09, Ehalepola Kumarihami Mawatha, Bogambara, Kandy.
Email - cpprda@yahoo.com / prdacpkd@gmail.com

මගේ අංකය / எனது இல. / My No. ........................

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025/04/22

**TO ALL BIDDERS**

MINUTES OF THE PRE-BID MEETING HELD ON 21ST APRIL 2025.

**ADDENDUM NO.01**

Reference to Procurement Notice published in 2/04/2025, calling Bid for construction works by Ministry of Road Development, Transport, Power & Energy and Housing and Construction- Central Province and also as informed in the pre –bid meeting, we issue this as Addendum No 01 to the prospective Bidders, in order to submit their bids, in accordance with Bid Document and this Addendum.

Thanking You

General Manager

Provincial Road Development Authority

Central Province

Eng. P.M.I.U.K. Puwakgolla
General Manager
Provincial Road Development Authority
Central Province

cc- Secretary - Chairman, Procurement Committee - fi. Pl.

Chairman, PRDA-CP - fi pl.

ADDENDUM NO -01

**Under SECTION – 6, (b) Special Specification of Bidding Document**

Series 500 – Surface Application, Surface Dressing and Surfacing

Clause 506.6 Measurement and Payment

(a) Measurement – Delete the text under this item and substitute as follows.

**(a) Measurement**

Asphalt concrete surfacing shall be measured by the following methods: -

( i ) For uniform Thickness

Asphalt concrete surfacing shall be measured by sq.m of mix furnished, spread, compacted, and accepted. Measurements shall be of the areas and thickness as shown on the drawings, described in the specification, or instructed by the Engineer.

Deficiencies in the thickness of the wearing course shall unless an overlay is constructed at the contractor's expense, result in a proportion only of the wearing course area being measured for payment. Proportions shall be determined by the thickness deficiencies and area proportions described below

The thickness of the asphalt concrete wearing course shall be determined by average caliper measurement of cores, rounded upwards to the nearest mm.

Paved sections to be measured separately shall consist of each 100 m section in each traffic lane. The last section in each traffic lane shall be 100 m plus the fractional part of 100 m remaining. At areas such as intersections, entranced, crossovers, ramps etc. It shall be measured at one section and the thickness of each shall be determined separately. Small irregular unit areas may be included as part of another section.

One core shall be taken from each section by the contractor at approved locations and in the presence of the Engineer. When the measurement of the core from any paved section is not deficient by more than 5mm from the specified thickness, the core will be deemed to be of the specified thickness as shown on the drawing.

When the measurement of the core from any paved section is deficient by more than 5 mm but not more than 15 mm, 2 additional cores spaced at not less than 25 m and as decided by the Engineer shall be taken and used together with the first core to determine the average thickness of such section.

When the measurement of the core from any paved section is less than the specified thickness by more than 15 mm, the average thickness of such section shall be determined by taking additional cores at not less than 5 m intervals parallel to the centerline in each direction from the affected location until, in each direction, a core is taken which is not deficient by more than 20 mm. Exploratory core deficient thickness will not be used in average thickness determinations.

Any deficiencies in the total thickness of wearing courses shall be subject to a proportional reduction in the area of wearing course measured for paying. Alternatively, the contractor shall construct all at his own expense, a wearing course overlay, if practicable in the judgment of the Engineer. Any such overlay shall be a minimum of 50 mm compacted thicknesses and to the specified standard of the course it is overlaying.

**Table 506-5 – Deficiencies in Thickness of Wearing and Binder Course**

| Deficiencies in Thickness as Determined by Cores (mm) | Proportion of Wearing Course Area measure for Payment |
|---|---|
| 0.0 to 5.0 | 100% |
| 5.1 to 10.0 | 80% |
| 10.1 to 15.0 | 60% |

All the core holes cut for the testing should be properly filled with asphalt cold mix immediately (or nay other equivalent material accepted by Engineer) as it need to seal water infiltration to the base. So until the core holes are properly filled by the contractor, only 70% of value of the asphalt payment shall be paid.